// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2360/50 – 2023 නොවැම්බර් මස 29 වැනි බදාදා – 2023.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2022/23

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මිය, පරිපාලන නිලධාරි (රා.ආ.), මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, වැලිකන්ද.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

1A – G 040884 – 16 (2023/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ජා-ඇල, වැලිගම්පිටිය, කොළඹ පාර, අංක 281, නීතිඥ අමල් ඒ. රන්දෙනිය මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2022/23

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මිය, පරිපාලන නිලධාරි (රා.ආ.), මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, වැලිකන්ද.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි පරිපාලන නිලධාරී (රා.ආ.) ලෙස සේවය කරන ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මහත්මිය හට 2020.11.26 දින පැවති සම්මුඛ පරීක්ෂණය අනුව සුදුසුකම් ලැයිස්තුවේ ඉහළ සිටි මැයට පරිපාලන නිලධාරී තනතුර හිමි ද හිමිනම් එය ලබා නොදීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් වසරකට පසු නැවත පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ දී පෙර සුදුසුකම් ලැයිස්තුවේ ඉහළ සිටි මැයව පහළට ගෙන ඒමත්, පහළ සිටි නිලධාරීන්ව ඉහළට ගෙන ගොස් පරිපාලන නිලධාරී පත්වීම් ලිපි ලබා දීමත් මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එලෙස අසාධාරණයක් සිදුව තිබේ නම් ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මහත්මියට හිමිවිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0339

මගේ අංකය: IR/COM/02/2019/222

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.07.28 වැනි දින අංක 2290/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.06.29 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

කේ. ඒ. ඒ. යූ. කුමාර මයා, හවුපේ වෙලගොඩවත්ත, අඹකොටුව, අගුළුගහ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීට්න් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 9, කෝවිල් වීදිය, කොළඹ 10.

අතර පවත්නා 2022.06.28 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්. ඒ. බුද්ධික ප්‍රභාත් කරුණාතිලක මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු ඩබ්. ඒ. බුද්ධික ප්‍රභාත් කරුණාතිලක මහතා එම ආරවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.06.29 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2019/222

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. ඒ. ඒ. යූ. කුමාර මයා, හවුපේ වෙලගොඩවත්ත, අඹකොටුව, අගුළුගහ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීට්න් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 9, කෝවිල් වීදිය, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමග, අංක 34/64, ඒ. බී. හේරත් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකයඃ IR/COM/02/2019/222.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

කේ. ඒ. ඒ. යූ. කුමාර මයා, හවුපේ වෙලගොඩවත්ත, අඹකොටුව, අඟුළුගහ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීට්න් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 9, කෝවිල් වීදිය, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීට්න් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවක කේ. ඒ. ඒ. යූ. කුමාර මහතාට ඉදිරිපත් කළ චෝදනා හා ලබා දී ඇති දඬුවම් මඟින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ සිදු වී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.